# රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,
# පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
# <u>ඇබෑර්තු</u>

## අධ්‍යක්ෂ ජනරාල් (01)
## (ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය - SLIDA)

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ (SLIDA) ඉහත තනතුර සඳහා සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**<u>සුදුසුකම් සහ නිපුණතාවන්</u>**

- **ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විෂය පථයන්ට අදාළ පශ්චාත් උපාධියක් සහිත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයෙකු වීම සහ විධායක / කළමනාකරණ තනතුරුවල වසර 20 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා ඉන් අවුරුදු පහක (05) කාලයක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද ලබා තිබීම.**

**හෝ**

- **ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විෂය පථයන්ට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් ලබා තිබීම.**

**සහ**

- **ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ විධායක මට්ටමේ නිලධාරියෙකු වශයෙන් වසර 20 ක පළපුරුද්ද සහ ඉන් වසර තුනක් (03) අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු වශයෙන් සේවය කර තිබීම.**

**හෝ**

- **ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විෂය පථයන්ට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් සහිත රජයේ හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ විධායක / කළමනාකරණ තනතුරුවල වසර 20 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා ඉන් අවුරුදු පහක (05) කාලයක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ (HM 2 -1) පළපුරුද්ද ලබා තිබීම.**

- **වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සහ රජයේ සේවකයන් උපරිම වයස් සීමාව බල නොපායි.**

- සියලු දත්ත ඇතුළත් ජීව දත්ත පත්‍රිකාව සමඟ අයදුම්පත්‍රය **2023 පෙබරවාරි මස 17 වන දින හෝ ඊට පෙර** ලැබෙන පරිදි, **ලේකම්, රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,නිදහස් චතුරශ්‍රය,කොළඹ 07** යන ලිපිනය වෙත එවිය යුතුය. අයදුම්පත්‍ර බහාලූ කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි **" ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර "** යන්න සඳහන් කළ යුතුය.

**නීල් බණ්ඩාර හපුහින්න**
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.